# කුරුණෑගල මහා නගර සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 12 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුරුණෑගල මහා නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, නගරාධිපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). ඉදිරිපත් කළ ගිණුම් වලින ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම පිළිබඳ හෙළි කිරීමක් සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පැවති තොගය, ජල විදුලි, ක්ෂේත්‍ර, ආදී ලෙස වෙනම හඳුනා ගැනීමකින් තොරව ලෙජර් ගිණුමෙහි පැවති රු.31,623,325 ක වටිනාකම එක් ශේෂයක් ලෙස ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම භාණ්ඩ සමීක්ෂණයක් කර තිබුණද ඒ අනුව තොගය ආගණනය කර නොතිබූ අතර ලෙජර් ගිණුම අනුව අවසාන ශේෂය වූ රු.31,623,325 ක ප්‍රමාණයම ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල කර්මාන්ත සඳහා ජාතික සවිය, ගමනැගුම හා විමධ්‍යගත අරමුදල් යටතේ රු.2,276,827 ක් ලැබී අදාල ගෙවීම් කර පැවතියද, එම ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානය වන විට තානායම් ගාස්තු ලෙස රු.1,639,905 ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතුව පැවතියද, එය මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට සභාව විසින් ගෙවිය යුතුව තිබූ විශ්‍රාම වැටුප් දායක මුදල් වූ රු.50,432,107 ක ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.188,033,634 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,621,426 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,573,017 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). 2005 සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉංජිනේරු අංශය ලබාගත් රු.1,414,048 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 03 ක ට අදාලව තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ රු. 234,139 ක් වටිනා චෙක්පත් ද, බැංකු ගිණුමකට අදාලව හඳුනා නොගත් හර රු. 32,338 ක් ද බැංකු ගිණුම් 3කට අදාලව හඳුනා නොගත් බැර රු. 417,592 ක් ද පැවතුණි. එමෙන්ම බැංකු ගිණුම් 03 කට අදාලව පැවති අගරු චෙක්පත් 15 කට අදාල රු.681,292 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට මිශ්‍ර තැන්පත් ශේෂය වූ රු.24,972,348 තුල වර්ෂ ගණනාවක සිට පැවත එන හඳුනාගෙන නිරවුල් නොකරන ලද අවස්ථා 07 කට අදාලව රු.10,227,547 ක ප්‍රමාණයක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 34,932 | 32,456 | 18,949 |
| (ii). | ජල විකුණුම් | 31,625 | 74,250 | 38,843 |
| (iii). | බදුකුලී | 49,083 | 47,640 | 2,205 |
| (iv). | බලපත්‍ර ගාස්තු | 5,812 | 5,747 | 56 |
| (v). | වෙනත් ආදායම් | 231,228 | 173,023 | 23,975 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 363,567 |
| (ii). | මුද්දර ගාස්තු | 12,523,467 |

2.3.3 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් ගාස්තු ලෙස රු.මිලියන 33 ක් පමණ බිල් කර පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් ශේෂය රු.18,949,371 ක් වු අතර ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). රජයේ දේපල යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව ආයතන 47 ක් සඳහා රු.1,247,457 ක වරිපනම් බිල්කර තිබු අතර එයින් ආයතන 14 කට අදාලව වසර 02 ත් 08 ත් අතර කාලයක සිට පැවත එන රු.2,828,408 ක හිඟ වරිපනම් බදු ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවතුණි.

(ආ). කොට්ඨාස 5 කට අදාලව සිදුකල නියැදි පරීක්ෂාවට අනුව බිල්කිරීම් කර පැවති දේපළ 473 ක් සඳහා වර්ෂ 10 කට වැඩි කාල පරාසයකට අදාළ රු.1,214,444 ක හිඟයක්ද, වර්ෂ 5 ත් 10 ත් අතර කාල පරාසයක් සඳහා දේපළ 262 කට අදාළව රු.853,226 ක හිඟයක්ද, වර්ෂ 5 ත් 1 ත් අතර කාල පරාසයක් සඳහා දේපළ 488 කට අදාළව රු.1,352,098 ක හිඟයක්ද ලෙස අදාළ බිල්පත් නිරවුල් නොකළ රු.3,419 ශේෂයක් පැවතුණි. එමෙන්ම දේපළ 152 කට අදාළව බිල්පත් නිරවුල් කරමින් පැවතියද, එකී දේපළ වලට අදාළව වසර 2 ත් 7 ත් අතර කාල පරාසයකට අදාළ එකතු වටිනාකම රු.853,671 ක හිඟයක් පැවතුණි.

(ඇ ) වරිපනම් ගාස්තු යටතේ වාර්ෂික සාමාන්‍යය රු.මිලියන 18 ක් පමණ වූ වරිපනම් හිඟ අයකර ගැනීම සඳහා කොට්ඨාස 12 ක් යටතේ 3% කොමිස් පදනම මත සහා සේවකයන් 5 දෙනෙකුද, 8% සිට 12% පරාසයක් තුල කොමිස පදනම මත බඳවාගත් සේවකයන් තිදෙනෙකු විසින් ද සිදුකර තිබුණි. මෙලෙස හිඟ එකතු කිරීමට අදාලව ලබාදී තිබූ හිඟ ලැයිස්තු තුල මුළු හිඟය පමණක් දක්වා තිබූ අතර, කාර්තුවක හිඟය, හිඟ කාල පරාසය දක්වා නොතිබීම, එක් එක් හිඟ ලැයිස්තුව මත අයකල මුදල වෙනම හඳුනාගත නොහැකි වීම, වරෙන්තු කාලය අවසානයේ හිඟ ලැයිස්තු ආපසු භාර දීමක් සිදුව නොතිබීම, එක් එක් හිඟ ලැයිස්තු අයවීම් ප්‍රගතිය අධීක්ෂණයට ලක් නොවීම, අදාල කුවිතාන්සි පොත් සඳහා දෙපිට කාබන් භාවිත නොකිරීම, එකතු කල මුදල් බැඳීමේ දින 2-9 ත් අතර ප්‍රමාදයන් පැවතීම, යම් නිශ්චිත කාලයට ලද මුදල එකවර නොබැඳීම වැනි අඩුපාඩු පැවතුණි.

(ඈ). වරිපනම් බදු කාර්යාලයට ගෙවීමට අදාලව නිකුත් කරනු ලබන වරිපනම් බදු බිල්පත නිකුත් කල දිනට පමණක් වලංගු වුවද, බිල් පතෙහි ඒබව සඳහන් නොකිරීම බිල්පත නිකුත් කල දිනට පසු දින වලදී එකී

බිල්පතට ගෙවීම් කල අවස්ථා පැවතීම, එලෙස නොගෙවන කුවිතාන්සි පත් වලට අදාල පරිගණක සටහන අවලංගු නොකල අවස්ථා පැවතීම, නොගෙවූ බිල්පත් පිළිබඳ විස්තර ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබීම. වර්පනම් අංශයේ පිලියෙල කරන දෛනික ලැබීම් වාර්තාව සහ බැංකුව විසින් පිලියෙල කරන දෛනික ලැබීම් ලේඛණය දෛනිකව හා කාලානුරූපව අධීක්ෂණයට ලක් නොවීම වැනි අඩුපාඩු පැවතුණි.

2.3.4 ජල ගාස්තු

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ජල ගාස්තු ලෙස රු.මිලියන 78 ක් පමණ බිල්කර පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයට වූ හිඟ ජල ගාස්තු වටිනාකම රු.38,343,592 ක් වූ අතර, ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(ආ). සභාව විසින් පුත්තලම් පාර වැසිකිළිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා බිල්කර තිබූ රු.2,169,641 ක හිඟ ජල ගාස්තුවක් ද, බස්නැවතුම්පල අවට ඉදිකිරීම් වලට ජලය සපයා ගැනිමට පුද්ගලික සමාගමක් ලබාගත් ජලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා බිල්කර තිබූ රු.316,086 ක ජල ගාස්තුවක්ද, නිසි පරිදි ගිවිසුම් වලට නොඑළඹීම හේතුවෙන් අයකර ගැනීම ගැටළුකාරී වී තිබුණි.

(ඇ). ජල පාරිභෝගික අංක 5163 (කුරුණෑගල මහ රෝහල) ට අදාල මනු කියවීමේ දෝෂ හේතුවෙන් 2007 ජූනි සිට 2008 ජූනි කාලයට අදාලව රු.5,229,822 ක ජල ගාස්තුවක් (එකතු කළ අගය බදු සහිත) අඩුවෙන් ගණනය කර තිබූ අතර මෙකී හිඟ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයවී නොතිබුණි.

(ඈ). කොට්ඨාස අංක 26 'B' හි ව්‍යාපාරික යටතේ ජල පාරිභෝගිකයින් 408 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.14,154,775 ක හිඟයක් පැවති අතර ජල පාරිභෝගිකයින් 116 ක් මාස 3 සිට වසර 1ට වැඩි කාලයක් තුල එකදු ජල බිල්පතක් හෝ නිරවුල් කර නොතිබුණි . සමාලෝචිත වර්ෂය අවසානයට ජල සැපයුම් විසන්ධි කර ඇති මුළු ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව 63 ක් වූ අතර එයින් පාරිභෝගිකයින් 34 දෙනෙකුට අදාලව අයවිය යුතු හිඟය රු.1,219,468 ක් විය.

2.3.5 බදුකුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). බිම් බදු අයකිරීමේ පදනමට සභාව විසින් ක්‍රීඩා සංගමයක් වෙත ලබාදී තිබූ ඉඩම හා ගොඩනැගිල්ලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට 2010 හා 2011 වර්ෂ වෙනුවෙන් රු.51,471 ක හිඟ බදු මුදලක් පැවති අතරම මෙම හිඟය සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමක්ද සිදුව නොතබුණි.

(ආ). බස්නැවතුම්පල සාප්පු සංකීර්ණයේ තෙවන මහලේ පවතින ආපන ශාලාවක් බදු දීමට සභාව විසින් 2005 වර්ෂයේදී අත්සන් කල බදු ගිවිසුම අනුව පෞද්ගලික වාහන නවතා තැබීම සඳහා වෙළඳ සංකීර්ණයට අයත් රථගාල පාවිච්චි කරනු ලබන්නේ නම් සභාව විසින් නියම කරන කුලියක් ගෙවිය යුතු වුවද,, 2005 වර්ෂයේ සිට 2008 මැයි දක්වාම එවැනි ගාස්තු අයකර නොතිබුණි. 2008 මැයි සිට එකතු කළ අගය බදුද සහිතව රු.15,000 ක මාසික බිම් බද්දක් අයකලද ඒ සඳහා වූ සභා තීරණයක් හෝ ගිවිසුමක් නොවූ අතරම සමාලෝචිත වර්ෂය අවසානයට වාරික 19 ක් ලෙස රු. 285,000 ක හිඟ ශේෂයක් පැවතුනි.

(ඇ). කුරුණෑගල මහනගර සභා බල ප්‍රදේශයේ පිහිටි රන්තලිය හා රජපිහිල්ල තානායම 1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/3 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරිය සතුකර තිබුණි. ගිවිසුම අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් සභාවෙන් අයකරන කළමනාකරණ ගාස්තුව 10% සිට 30% දක්වා ඒකපාර්ශ්විකව වැඩිකර තිබුණි. එමෙන්ම රන්තලිය (නව) තානායම සඳහා 1999 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.1,086,111 ක හිඟ කුලියක්ද රජපිහිල්ල තානායම (පැරණි) සඳහා රු.916,650 ක හිඟ කුලියක් ද සභාවට අයවිය යුතුව තිබුණි .

2.3.6 <u>විනෝද බදු</u>

(අ) මහ නගර සභාවට අයත් මාළිගාපිටිය ක්‍රීඩාංගනය සංගීත සංදර්ශණ හා සැණකෙලි 9 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල ලබාදී තිබුණද ඊට අදාලව විනෝද බදු මුදල් අයකර ඇති බවක් හඳුනා ගත නොහැකි විය.

(ආ) මහනගර සභා සභා බල ප්‍රදේශය තුල සිනමාහල් 4 ක් පැවති අතර එකි සනමාහල් හිමිකරුවන් විසින් මුද්‍රණය කර ලබාදෙන ප්‍රවේශ පත් වලට විනෝද බදු සඳහා මුද්‍රා තැබීම සභාව විසින් සිදුකර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ප්‍රවේශ පත් මුද්‍රා තැබීමේදී සිනමාහල් වල මාස 2 ත් 22 ක් වැනි කාලයට ප්‍රමාණවත් ප්‍රවේශ පත් එකවර මුද්‍රා තැබූ අවසථා 30 ක් පමණ පැවතීම,

(ii) සිනමාහල් 3 කට අදාලව 2011 ජනවාරි - සැප්තැම්බර් කාලයට අදාලව ලබාදෙන දෛනික විනෝද බදු වාර්තා අනුව අවස්ථා 15 කදී සිනමාහල් වලින් නිකුත් කරන ලද ප්‍රවේශ පත් 31,428 ක් මුද්‍රා තබා ඇති බව සභාවේ ප්‍රවේශ පත් මුද්‍රා තැබීමේ ලේඛනය අනුව තහවුරු නොවීම,

(iii) ප්‍රවේශ පත් මුද්‍රා තැබීමේදී අනුපිළිවෙලට මුද්‍රා තබා නොතිබූ අවස්ථා පැවතීම හේතුවෙන් එක් සිනමා ශාලාවක බොක්ස් යටතේ වූ ප්‍රවේශ පත් 10098 ක් මුද්‍රා තබා ඇති බව තහවුරු නොවීම.

2.3.7 <u>ව්‍යාපාරික ගොඩනැගිලි අනුකූලතා ගාස්තු අයකිරීම</u>

නාගරික සංවර්ධන අධිකාරිය මගින ප්‍රසිද්ධ කර ඇති 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දිනැති ගැසට් නිවේදනය අනුව යම් ඉදිකිරීමක අනුකූලතා සහතික නොමැතිව පදිංචිවීම, භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන්, එක් දිනක් සඳහා රු.50 බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් අයකළයුතු වුවත් මහනගර සභා බල ප්‍රදේශය තුල 2003 - 2010 කාලය තුල එලෙස අනුකූලතා සහතික ලබානොගත් ගොඩනැගිලි 21 ක් වෙනුවෙන් අයකළ හැකිව තිබූ රු. 497,800 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. එමෙන්ම 2005 දෙසැම්බර් 19 දිනැති අංක 5(1) දරන නගරසභා සභා සම්මුතිය අනුව, ගොඩනැගිලි අයදුම් පත්‍රය අනුමත කරවා ගැනීමෙන් පසුව, අනුකූලතා සහතිකය ලබාගන්නා තෙක් වාර්ෂිකව රු.200 ක ගාස්තුවක් ගෙවා ගොඩනැගිලි අයදුම් පත්‍රය අළුත් කරවා ගතයුතු වුවත් ව්‍යාපාරික ස්ථාන 138 කට අදාලව එලෙස අඛණ්ඩව ගොඩනැගිලි අයදුම් පත්‍රය අළුත් කරවා ගෙන නොතිබූ අතර, එලෙස බලපත්‍ර අළුත් කරගනු ලැබීමට කටයුතු කළෙ නම් සභාවට රු.114,800 ක ආදායමක් උපයා ගත හැකිව තිබුණි. " මෙම මුදල්

නිසි පරිදි අයකිරීමට කටයුතු කරන බව " නාගරික කොමසාරිස් 2012 අගෝස්තු 06 දින මා වෙත වාර්තා කර තිබුණි.

2.3.8 මිශ්‍ර ආදායම්

සභාව විසින් සිදුකල මිශ්‍ර ආදායම් එකතු කිරීම් වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ජූනි වන විට රු.මිලියන 16 ක පමණ ටිකට් පත් ප්‍රමාණයක් රථ පාලිකාවන් වෙත හා බස්නැවතුම්පල මුදල් එකතු කරන්නන් 16 දෙනෙකු වෙත නිකුත් කර පැවතියද, උප පත්‍රිකා නිකුත් කිරීම් ලේඛනයෙහි එක් එක් පුද්ගලයා අනුව නිකුත් කල පොත් සංඛ්‍යාව, ආපසු භාරදීම, මුදල් බැදීම වෙන වෙනම හඳුනාගත හැකි ලෙස දක්වා නොතිබීම, ඔවුන්ගේ මුදල් බැදීම් හා මුදල් අයකිරීම් ප්‍රගතිය කාලානුරූපව වෙනත් නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් නොවීම, මුදල් එකතු කරන්නන් විසින් මුදල් බැදීම දින 2ත් 5ත් අතර ප්‍රමාදව සිදුවීම වැනි අඩුපාඩු පැවතුණි.

2.4 මානව සම්පත් කළමනාකරණය

කම්කරු , මුරකරු, රියදුරු තනතුරු අනුමත සංඛ්‍යාව 255 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට 236 දෙනෙකු සේවයේ යොදවා තිබූ අතර මෙකී තනතුරු වල සමාලෝචිත වර්ෂය අවසානය වන විට අනියම් ආදේශක පදනම යටතේ සභාවෙන් වැටුප් ලබන 157 දෙනෙකු බඳවාගෙන තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

සභාව විසින් ඇස්තමේන්තු ගත වටිනාකම රු.1,375,000 ක් මත සෘජු ශ්‍රම පදනමට ඉටුකර තිබූ කර්මාන්ත 17 කට අදාලව, පළාත් පාලන කොමසාරිස් (වයඹ) ගේ 2007 ජූනි 01 දිනැති අංක 2007/3 තාක්ෂණ දරන චක්‍රලේඛයේ උපදෙස් පරිදි වූ ද්‍රව්‍ය ඇස්තමේන්තු, ද්‍රව්‍ය ලබාගැනීම්, ද්‍රව්‍ය නිකුත් කිරීම, ආපසුභාරදීම, චෙක්රෝල් වාර්තා, වැඩ අවසන් වාර්තා ඇතුලත්ව ගොනු සකස්කර නොතිබුණි. එමෙන්ම සකස්කර තිබූ කර්මාන්ත 14 කට අදාල ගොනුවල ශක්‍යතා වාර්තා, ද්‍රව්‍ය විශ්ලේෂණ / ද්‍රව්‍ය ඇස්තමේන්තු, චෙක්රෝල් වාර්තා, ප්‍රවාහන වියදම් විශ්ලේෂණ අවසන් පරීක්ෂණ / මිනුම් වාර්තා ද ගොනුකර නොතිබුණි.

2.6. මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.383,847 ක් වූ අයවීම හිඟහිට ඇති සේවක ණය ශේෂය තුල පැවති රු.254,318 ක ණය ශේෂය 2007 වර්ෂයේ මියගිය නිලධාරියකුට අදාල වන අතර සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකී ශේෂය නිරවුල් කර ගෙන නොතිබුණි. සේවය අතහැර ගිය සේවකයන් දෙදෙනෙකුට අදාල රු.95,120 ක ණය ශේෂය 2007 වර්ෂයේ සිට අයකරගත නොහැකිව පැවතුණි.

(ආ). ඉඩම් හා ගොඩනැගිලි ලේඛණයක් පැවතියද එය යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර, කාලානුරූපව ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය ද කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාලව ඉඩම් හා

ගොඩනැගිලි හැර ලෙජර් ගිනුම් අනුව අගය රු.120,691,050 ක් වූ වත්කම් සමීක්ෂණය කර තිබුණ ද ඒවා සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අගය කර නොතිබුණි.

(ඇ). සභාවේ සේවය කර විශ්‍රාම ගන්වා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් 2011 මැයි දක්වා නිසි පරිදි නොගෙවීම නිසා එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 50,432,107 ක්ව තිබුණි.

(ඈ). සභාවට අයත් කි.මී. 35 ක පමණ කානු පද්ධතියක් ද, සුසාන භූමියක් ද ළමා උද්‍යාන 2 ක්ද පැවති අතර සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා දරා ඇති නඩත්තු පිරිවැය වෙනම හඳුනාගත නොහැකි විය.

(ඉ). සභාවට අදාලව සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.7 <u>අභ්‍යන්තර විගණනය</u>

අභ්‍යන්තර විගණන වැඩසටහන් යටතේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) ගොඩනැගිලි අයදුම්පත් නිකුත් කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම

(උ) සැපයුම් කළමනාකරණය

(ඌ) සේවක මණ්ඩල කළමනාකරණය

(එ). වාහන උපයෝජනය